

# ඔහු නැති කරළිය අඳුරුය!



ආර්. ආර්. නම් පරිණත නාට්‍යකරුවා



ආර්. ආර්. නම් තරුණයා

**ශ්‍රී** ලංකාවේ මෑත යුගයේ විසූ නාට්‍යවේදීන් අතර සුවිශේෂ කීර්තිනාමයක් හිමිකරගත් ආර්. ආර්. සමරකෝන් කලාකරුවාණෝ පසුගිය මාසයේ අප අතරින් වියෝවූහ. නාට්‍යකරුවෙකු පමණක් නොව නවකතා හා කෙටිකතාකරුවෙකු ලෙස ද, කවියෙකු, ලේඛකයෙකු හා වශයෙන් ද ආර්. ආර්. ප්‍රකටව සිටියේය. නාට්‍ය ක්‍ෂෙත්‍රයේත්, ඉන් පිටතත් හිතවතුන් ද, ප්‍රේක්‍ෂක ජනතාව ද බොහෝ දෙනා විසින් ඔහු හඳුන්වනු ලැබුයේ ආර් ආර් යනුවෙන් වුවද ඒ වාසගම කුමක්දැයි බොහෝ අය දැන සිටියේ නැත. ආර් ආර් යනු රණසිංහ රාජපක්‍ෂ ය.

1939 අගෝස්තු මාසයේ නාවලපිටියේ දී උපන් සමරකෝන් මූලික අධ්‍යාපනය ලදුයේ දෙකිඳ රජයේ පාසැලෙනි. ඉන්පසු නාවල පිටිය ශාන්ත ඇන්ඩෲ විදුහලෙන්ද, මහනුවර කිංස්වුඩ් විදුහලෙන්ද අධ්‍යාපනය ලත් ඔහු ලිපිකරුවෙකු ලෙස සතොස ආයතනයට බැඳුණේය. එම ආයතනය සමරකෝනුන්ගේ නාට්‍යමය හැකියාවන් පැළකර මතුකර ලන්නට මූලික තෝතැන්න වූ බව කිව යුතුය. එතැන් පටන් ඔහු සිය සිතැඟි පරිදි විවිධ නිර්මාණයන් කරළියට ගෙන එමින් ශ්‍රී ලංකාවේ වේදිකා නාට්‍ය ක්‍ෂෙත්‍රයට පෙර නොවූ නවතාවක් ප්‍රවනතාවක් එක් කළේය. ඔහුගේ ඇල්ම යොමුවුණේ පරිවර්තන නාට්‍ය යන්ට නොව ස්වතන්ත්‍ර නිර්මාණයන්ටය. එම නිර්මාණයන්හිදී ඔහු පිළිබඳ පැහැදිලිව පෙනුණු විශේෂත්වයක් වූයේ එකී තෝරාගත් චරිත ලාංකීය ජනසමාජයේ අතිශය පීඩාවට පත් මිනිසුන් වීමයි. නාගරිකත්වයේ පහළම මට්ටමට අයත්ව සිටින බෙබද්දන්, ටැක්සි කාරයන්, කම්කරුවන්, සොරුන්, වංචනික යින්, ගණිකාවන්, ගැට කපන්නන් ආදී වශ යෙන් සාමාජ ගර්හාවට ලක්වුණු මිනිසුන්ගේ ජීවිතයන්හි අභ්‍යන්තර දුක්ඛදායක බව මෙන්ම, උණුසුමත් කියාපාන්නටය.

කැළණි පාලම, ඉඩම, අහසින් වැටුණු මිනිස්සු, දූවිලි, ජේලර් උන්නැහේ, කකුල් හතරේ ඉලන්දාරියා, කපුටු බෝ, ලෙඩක් නැති ලෙඩෙක්, චරිත දෙකක් ආදී ජනප්‍රිය වේදිකා නාට්‍ය රැසක් කරළියට ගෙනා ආර් ආර්, අහසින් වැටුණු මිනිස්සු සඳහා 1971 දී රාජ්‍ය නාට්‍ය උළෙලේදී සම්මාන 9 ක් හිමිකරගන්නට සමත් විය. 1975 දී ඉඩම නාට්‍යයද රාජ්‍ය සම්මාන දිනාගත්තේය.

ගැඹුරු ජීවන දෘශ්ටියකින් ජීවිතයට එබී බැලූ ඔහු සෑම නිර්මාණයකටම එකී ගැඹුර එක්කරන්නට උත්සාහ කළේය. තමාටම ආවේණික රීතියක් ඔස්සේ නාට්‍යයන්හි චරිත මෙහෙයවූ ඔහු දේශපාලනික හා සාමාජයික තේමාවන් ඒ සඳහා තෝරා ගත්තේය. එසේම ඔහුගේ නාට්‍යය පණ්ඩිතමානී ගැඹුරු දර්ශනයන් පසුබිම් වුණු තේමාවන් නොව සියළුම බුද්ධි මට්ටමේ ප්‍රෙක්‍ෂකයන්ට වහා වැටහෙන තේමාවන් වීය. ඒ තේමා මින්පෙර බොහෝ අය නාට්‍ය කරණයේදී භාවිතයට ගත් ඒවා වුවද සමරකෝන් එය ඉදිරිපත් කළේ වෙනස් අයුරින් අද සමාජයට අනුරූප වන පරිද්දෙනි. නිදසුනක් ලෙස **සිංහබාහු** නාටකයත්, **කැළණි පාලමත්** යන දෙකම පිය පුතු ගැටුම කියන හාත්පසින්ම වෙනස් නාටකයන්ය.

ඔහු නිශ්පාදනය කළ නාට්‍ය අතුරින් **අහසින් වැටුණු මිනිස්සු**, **ඉඩම** සහ **කැළණිපාලම** යන නාට්‍ය තුන අප රටේ බහුතරයකගේ කතාබහට ලක්වුණු නාට්‍ය වූයේය. එයිනුදු කැළණි පාලම ආර් ආර් ගේ වඩාත්ම ප්‍රසිද්ධ නාට්‍යය යයි කිවහැකිය. ඔහු සමාජ දුර්වලතාවන්ට පහර දෙන්නට දෙබස් උපයෝගී කරගැන්මේ විශේෂ කුසලතා ඇත්තෙකු වීය. සමහර දෙබස් දෙපිට කැපෙන ඒවා වුවද ඉන් බොහෝ විට ගැඹුරු හාස්‍යයක් මතුකර ලීය.

නවකතාකරුවෙකු ලෙස ද ඔහු දැක්වූ කුසලතාව විශිෂ්ඨය. එක කුස උපන් එවුන්, සුන්දරා සහ සොබනි, රන්තරුව, තලමල, ගේ කුරුල්ලෝ, සඳ එළිය කළුවරයි, ලොකු අක්කා, අකලංක, චන්ද්‍රතාප, දෙහදක් අතර, ගැහැණිය කගේ චරිතයක්, එක් සත්‍ය කතාවක් ඔහු ලියූ නවකතාවෝ වෙති. මේ සියල්ල අතුරින් ඔහුගේ හොඳම නවකතාව ලෙස බොහෝ දෙනා පිළිගන්නේ 1971 දී සාහිත්‍ය සම්මාන දිනූ **ගේ කුරුල්ලෝ** නම් නවකතාවයි. දරුවන් කෙරෙහි වූ අපේක්‍ෂාවන් බිඳුණු පියෙකුගේ ජීවිතයේ සිදුවීම් ඇසුරෙන් ලියැවුණු ගේකුරුල්ලෝ මධ්‍යම පන්තික පවුලක එක් දුක්බර පැත්තක් කියාපාන්නකි.

**සුදු වළාකුළු** කොටස් වශයෙන් පළවූ ඔහු ලියූ ගුවන්විදුලි නාට්‍යයකි

ආර් ආර් හොඳ නාට්‍යකරුවෙකු වගේම හොඳ කාව්‍ය චින්තාවක් ඇති කලාකරුවෙකු බව දැන-සිටියේ ඔහුගේ සමීප හිතවතුන් පමණි. එහෙත් 2002 දී නුගේගොඩ සරසවි ප්‍රකාශකයින් මගින් එළිදැක්වූ **රාත්‍රිය අවදි නොවේ** නම් ඔහුගේ කුළුඳුල් පද්‍ය සංග්‍රහය ඔහු පරිණත කවියෙකු ද බව මනාව පැහැදිලි කරන්නකි.

එම පද්‍ය සංග්‍රහයේ බොහෝ මාතෘකා අතුරින් **අඩුකුලේ කවි** යන සිරස යටතේ ඇති පැදි වැල විශේෂත්වයක් ගනී

බුදුගේ කළුවරට වී මම බලන් ඉමී
ඔබ පිදු පිච්ච මල් රහසේ සිඹින් නෙමී
පාළු පැලේ තනිවම නිදි කිරන් නෙමී
හීනෙන් ඔබ සමග කෙකටිය කඩන් නෙමී

කුලභේදය හරස්වීම නිසා ආදරවන්තයින් දෙදෙනෙකුට මුහුණ පෑමට සිදුව ඇති ශෝචනීය ඉරණම හා ඔවුන්ගේ ආදරයේ ඇති අව්‍යාජ බව කීමට ආර් ආර් යොදා ගන්නා උචිත උපමා රූපක සහෘද සිත්හි සියුම් වේදනාවක්ද ඇතිකරයි. ඔබ පිදූ පිච්ච මල් රහසේ සිඹින්නෙමී යනුවෙන් කුලහීන තරුණයාගේ වචන දනවන්නේ කොතරම් ආරයක් සිත්හි තිබුණද සැබෑ ලෝකයේ ඔවුන් දෙදෙනාට ළං විය හැකි ප්‍රමාණය එපමණක් බවය.

ආර් ආර් දියණියන් දෙදෙනෙකුගේ පියෙකි ඔහු දෙවන වර විවාහ වූයේ සුප්‍රකට නාට්‍ය ශිල්පිණියක හා නිවේදිකාවක වන රම්‍යා වනිගසේකර සමගය.

මම ආර් ආර් හඳුනාගත්තේ 1970 දී ඔහුගේ **ගේ කුරුල්ලෝ** නම් නව කතාව පිටවූ දිනවලමය කොළඹ යූනියන් පෙදෙසේ සතොස කාර්‍යාලයට හිතවතෙකු හමුවීමට ගිය දිනක මගේ මිතුරාගේ මේසයට යාබද මේසයේ ලිපි ගොණු වගයක් පෙරළමින් සිටි ආර් ආර් මගේ මිතුරා විසින් මට හඳුන්වා දෙන ලදී ඔහුගේ **ගේ කුරුල්ලෝ** නමින් අළුත් නවකතාවක් ඊට කලින් සතියේ නිකුත් වූ බව ද කීවේය. ඒ හැඳුනුම්කම නිසාම මම එම නවකතාව මිළදී ගෙන කියවූවෙමි. සතොසට ගිය ඊළඟ වාරයේ නවකතාව පිළිබඳ මම ඔහුට ප්‍රශංසා කළෙමි. ඒ එදා ඇතිවූ මිතුරුකම අප අතර ඔහුගේ කල දක්වාම පැවතියේය.



ආර් ආර්ගේ මුල් කැළණි පාලම නාට්‍යයේ රඟපෑ නිල් අලස් හා රම්‍යා වනිගසේකර

මා ශ්‍රීලංකාවේ ගත කළ හැත්තෑවේ දශකයේ අපි නිතර අවන්හල් වලදී හමුවුනෙමු. නාට්‍ය ගැනද චිත්‍රපට ගැනද නිතර කතා කළෙමු. එකල කොටුවේ මධ්‍යම බැංකුවේ සේවයේ නියුතු බොහෝ හිතවතුන් අතර සිටි ලේඛක ලෙස්ලි බොතේජු මගේත් ආර් ආර් ගේත් හිතවතෙකි. ඇතැම් සති අන්තවල අපි ජාඇල ඒකල ලෙස්ලිගේ නිවසට බසයෙන් ගියෙමු. ඒය අතිශය සුන්දර කාල පරිච්ඡේදයකි.

1980 වසරේ ආර් ආර් ලන්ඩන් චාරිකාවකට පැමිණි කල මා හමුවන්නට අපේ නිවසට ආවේය. එකල ලෙස්ලි බොතේජුද ජනසංනිවේදන පාඨමාලාවක් හැදෑරීම පිණිස ලන්ඩනයට විත් සිටියේය. මම ලෙස්ලිටද එන්නට කීවෙමි. මුළු දවසම අප ගෙවූයේ කකා බිබී, ලංකාවෙන් පටිගතකරගෙන විත් තිබුණු ජනකවි, වන්නම් හා නාඩගම් ගීත අසමින්, උස් හඬින් ඒවා ගයමින් ඒවායේ අරුත් විග්‍රහ කරමිනි. ඒ දිනය මා සිහි කරන්නේ අපමණ සතුටිනි. ලෙස්ලි දැනට වසර කීපයකට පෙර වියෝවිය. ආර් ආර් ද දැන් අප අතර නැත. සියල්ල හිටිවන වෙනස්විය.



1971 දි සමරකෝන්ගේ රාජ්‍ය සම්මාන 9 ක් දිනූ අහසින් වැටුණු මිනිස්සු නාට්‍යයේ ප්‍රධාන නිළිය වූ ප්‍රේමා ගනේගොඩ හා චන්ද්‍රා කලුආරච්චි රඟපෑ ජවනිකාවක්.

ආර් ආර් ඉතා සංවේදී හදවතක් තිබූ කලාකරු-වෙකි. ඒ සංවේදීතාව ඔහු ලියන නාට්‍ය දෙබස්වල ඇත. ඒ දෙබස් ආත්මය කරගත් කල වේදිකාවට පිවිසෙන නළුවාට හෝ නිළියට සිය රංගනය සාර්ථකව ආයාසයෙන් තොරව ඉදිරිපත් කළ හැකිය. ප්‍රේක්‍ෂකයෝ ඇසි පිය නොගසා වේදිකාව දෙස බලා සිටිති. සාමාන්‍ය ජනයාට අහසින් වැටුණු මිනිස්සු, ඉඩම, කැළණි පාලම හිතට වැදුණේ එය කෙළින්ම ඔවුන් ඇමතූ නිසා ය.

ඒ නිර්මාතෘ ආර් ආර් පිටවී ගියේය. පහන් නිවුණි. වේදිකාව ද, රඟහල ද මුළුමනින් අඳුරු ය.

හිතවත ඔබට නිවන් සුව !

♦ දයා ආනන්ද


## FAST CASH අනුග්‍රහයෙන් එක්සත් රාජධානියේ
## ශ්‍රී ලංකා පාපන්දු සැණකෙළිය




**7-a-side Seniors Football Tournament**
**7-a-side Juniors Tournament (Ages 11-14)**

**2010 September 26 from 9am - 7pm**
**JUS Sports Centre**
**The Mall, Kenton, Harrow, Middlesex HA3 9TE**

*Chief Guest* - Mr Nihal Jayasinghe - The SL High Commissioner - UK
*Other Sponsors* - Sri Lankan Airlines, Bank of Ceylon (London Branch) and SLeventsinUK
*Please contact the following for sponsorship and souvenir advertising:*
Asoka - 07725643008, Ranjith - 07515888631, Upali 0208 450 9052
Ananda - 07956831996
*Please support this worthy cause to develop youth football in Sri Lanka*